ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2025.07.02

එස්.එම්.එස්.යූ.සෙනෙවිරත්න මහතා,
අංක : 1/46,
යක්කල පාර,
කැකිරාව.

පැමිණිලිකාර පාර්ශවය

1. අතුල ගල්කැටිය මහතා,
සභාපති,
එයාර්පෝට් ඇන්ඩ් ඇවියේෂන් සර්විසස් ශ්‍රී ලංකා පුද්ගලික සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක.

2. සෙනරත් හෙට්ටිආරච්චි මහතා,
ගුවන් සේවා කළමනාකරණ සේවා ප්‍රධානි,
එයාර්පෝට් ඇන්ඩ් ඇවියේෂන් සර්විසස් ශ්‍රී ලංකා පුද්ගලික සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක.

වගඋත්තරකාර පාර්ශවය

***පැමිණිලි අංකය : HRC/2259/24***

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :**

පැමිණිලිකරු තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර සිටින්නේ, තමා දැනට ගුවන් තොටුපල හා ගුවන් සේවා ශ්‍රී ලංකා පුද්ගලික සමාගමේ පර්යන්ත අධිකාරිවරයෙක් වශයෙන් සේවය කරන බවත්, තමා හට ව්‍යාපාර කළමනාකරණය සම්බන්ධයෙන් එංගලන්තයේ University of Glyndwer විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධිධාරියෙක් බවත්, නීතිවේදී උපාධිය ද, එංගලන්තයේ University of Bedfordshire හි Msc. In Aviation Management උපාධියක් ද, එංගලන්තයේ Buckinghamshire University හි International Higher Diploma In law සම්බන්ධ උපාධියක් ද, Civil Aviation Training Academy ආයතනයෙන් Diploma in Aviation Management සහතිකයක් ද, CSTS ආයතනයෙන් Diploma in law සහතික පත්‍රයක්ද පවතින බවත්, නීති විද්‍යාලයේ අවසන් වසරේ නීති සිසුවෙක් ද වන බවයි.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තමා විසින් සහකාර ගුවන් තොටුපල කළමනාකරණ තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඒ සඳහා අයදුම් කළ බවත්, ඉන්පසුව පවත්වන ලද තරඟ විභාගයට පෙනීසිට ලකුණු 88 ක් ලබාගෙන දෙවන ස්ථානය හිමිකර ගත් බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කර තිබූ බවත්, එම සම්මුඛ පරීක්ෂණයට පෙනීසිටි බවත්, නමුත් එකී සම්මුඛ පරීක්ෂණය කිසිදු විනිවිදභාවයකින් තොරව පැවැත්වූ බවත්, සුදුසුකම් තිබියදී තමාව අදාළ තනතුරට තෝරා පත් කර නොගත් බවත්ය.

පැමිණිලිකාර පාර්ශවය තවදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින්නේ, මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ සිට සම්මුඛ පරීක්ෂණය දක්වා සේවා ව්‍යවස්ථාවට පරිභාහිරව වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ බවයි.

ගුවන් සේවා ශ්‍රී ලංකා පුද්ගලික සමාගමේ පවතින සේවා ව්‍යවස්ථාවට අනුව මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට මූලික සුදුසුකම වන්නේ මූලික උපාධියක් බවත්, අභ්‍යන්තර අයදුම්කරුවන්ට වයස් සීමාවක් නොමැති බවත්, බාහිර අයදුම්කරුවන් වයස අවුරුදු 35ට අඩු විය යුතු බව දක්වා තිබූ බවයි. එහෙත් අභ්‍යන්තර අයදුම්කරුවකු වන සී.ඒ.එම්.ඩී.පෙරේරා නමැති අයට මූලික උපාධිය නොමැතිව තිබියදී තරඟ විභාගයට පෙනීසිටීමට අවස්ථාව ලබාදී පසුව සම්මුඛ පරීක්ෂණයෙන් පසු ඔහු වෙත අදාළ උසස්වීම ලබාදීමට කටයුතු කරන ලද බවත්, එසේම වයස අවුරුදු 35 ට වැඩි බාහිර අයදුම්කරුවකු වන ආර්.එස්.සී.ප්‍රදීප් නැමති අයට තරඟ විභාගයට පෙනීසිටීමට අවස්ථාව ලබාදී පසුව ඔහුව ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයේදී තෝරාගෙන තිබූ බව තවදුරටත් පැමිණිල්ල විසින් දක්වා ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව,

- රැකියා දැනුමට උපරිම ලකුණු 30ක්ද,
- අධ්‍යාපන සුදුසුකම් වලට ලකුණු 10ක්ද,
- ස්වාධීන තීරණ ගැනීම සම්බන්ධයෙන් ලකුණ 10ක්ද
- නායකත්වය සඳහා උපරිම ලකුණු 10ක්ද,
- භාෂා දැනුමට උපරිම ලකුණු 20ක්ද,
- සේවා හා පළපුරුද්ද සඳහා උපරිමය ලකුණු 20ක්ද

ලෙස ලකුණු ලබාදීමේ ක්‍රමවේදය දක්වා ඇති අතර, අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද යන අයිතමයන් සඳහා පමණක් නිර්ණායකයන් මත ලකුණු ලබාදෙන ලද බවත්, අනෙක් අයිතමයන් සඳහා ලකුණු ලබාදීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි සිදුකරන ලද බවත්ය.

ඒ අනුව අධ්‍යාපන සුදුසුකම් සඳහා තමාට උපරිම ලකුණු 10ක්ද, සේවා පළපුරුද්ද සඳහා ලකුණු 13ක්ද ලබාදී ඇති බවත්ය. රැකියා දැනුම පිළිබඳව තමාට ලබාදී ඇත්තේ ලකුණු 10ක් පමණක් වන අතර, බාහිර අයදුම්කරුට තමාට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාදී ඇති බව පැමිණිල්ල මඟින් දක්වා ඇත.

පැමිණිලිකාර පාර්ශවය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, තමා හට අධ්‍යාපන සුදුසුකම් හා අදාළ සේවා පළපුරුද්ද තිබියදී සහ තරඟ විභාගයෙන් දෙවන ස්ථානය ලබාගෙන තිබියදී සම්මුඛ පරීක්ෂණයේදී තමාව තෝරාපත් කර ගෙන නොමැති බවයි.

තවද, මීට පෙර කිසිදු අවස්ථාවක බඳවා ගැනීමේදී සලකා බලන මූලික සුදුසුකම් සපුරා නොමැති සහ බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් වලට පරිබාහිරව කිසිදු බඳවා ගැනීමක් සිදුනොකළ බවත්, එහෙත් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත සඳහන් අයදුම්කරුවන්ට එම අවස්ථාව ලබාදීමෙන් ඔවුන්ට පුද්ගලික අනුග්‍රහයක් දක්වා ඇති බවයි.

එසේම අනුමත බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ව සිටි බවත්, ඔවුන් දෙදෙනා එහිදී ඉහත සඳහන් කළ අයදුම්කරුවන්ට පුද්ගලික අනුග්‍රහයක් දක්වා ඇති බවත් සඳහන් කරන අතර, මීට පෙර තමා විසින් මෙම තනතුර සඳහා මූලික සුදුසුකම වන මූලික උපාධිය නොමැති අවස්ථාවකදී ඉල්ලුම් කළ බවත්,

එම අවසථාවේදී තමාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව මේ සම්බන්ධයෙන් ආයතනයට අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, එම අභියාචනය ද ප්‍රතික්ෂේප කරන ලද බවත්, නමුත් සී.ඒ.එන්.ඩී.පෙරේරා යන අයගේ අභියාචනය පිළිගෙන ඇති බවත්, ඒ තුළින් එම අයදුම්කාරියට පුද්ගලික අනුග්‍රහයක් ලබා දී ඇති බවටත් තහවුරු වන බවයි.

තවද මෙම තනතුර සඳහා අපේක්ෂකයින් පනස් හත් දෙනෙකු ඉල්ලුම්කර තිබූ බවත්, ඒ අතරින් ගුවන් සේවා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධියක් පවතින එකම අපේක්ෂකයා තමා බවත්, එම උපාධිය තමා එංගලන්ත රජයේ විශ්ව විද්‍යාලයකින් ලබා ගත් බවත්, නීතිවේදී උපාධිය එංගලන්ත විශ්ව විද්‍යාලයකින් හදාරා ඇති බවත්, කළමනාකරණ සහ ගුවන් සේවා කළමනාකරණ උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇති බවත්, තමා වසර දෙකක කාලයක් එංගලන්තයේ රැදී සිටි බවත්, ඒ අනුව තමා හට සන්නිවේදනය සම්බන්ධයෙන් ලබාදී ඇති ලකුණු ප්‍රමාණය පිළිගත නොහැකි බව පැමිණිලිකාර පාර්ශවය විසින් වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කර ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u> :

වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරමින්, ගුවන් තොටුපල හා ගුවන් සේවා ශ්‍රී ලංකා පුද්ගලික සමාගම විසින් අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව සහකාර ගුවන් තොටුපල කළමනාකරු තනතුර සඳහා බාහිර සහ අභ්‍යන්තර අයදුම්පත් කැඳවීම් සිදුකරන ලද බවයි. ඒ අනුව 2024.05.06 දින සහකාර ගුවන් තොටුපල කළමනාකරු තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද බවත්, එහිදී පහත පරිදි නිර්ණායකයන් සඳහා ලකුණු ලබාදීම සිදුකරන ලද බවයි.

- රැකියා දැනුම සඳහා උපරිම ලකුණු 30ක්ද,
- අදාළ වෙනත් සුදුසුකම් සඳහා ලකුණු 10ක්ද,
- ස්වාධීන තීරණ ගැනීම සඳහා ලකුණු 10ක්ද,
- නායකත්ව හැකියාවට ලකුණු 10ක්ද,
- සන්නිවේදන හැකියාවට ලකුණු 20ක්ද,
- සේවා පළපුරුද්දට ලකුණු 20ක්ද වශයෙන් මුළු ලකුණු 100ක් වන බවයි.

මෙහිදී රැකියා දැනුම, ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව, නායකත්ව හැකියාව සහ සන්නිවේදන හැකියාව යන නිර්ණායකයන් සඳහා සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් විසින් මුහුණ දුන් ආකාරය අනුව ලකුණු ලබාදෙන ලද බවත්, ඒ අනුව පැමිණිලිකාර එස්.එම්.එස්.යූ.සේනාරත්න මහතාට රැකියා දැනුමට ලකුණු 10ක්ද, වෙනත් සුදුසුකම් වලට ලකුණු 10ක්ද, ස්වාධීන තීරණ ගැනීම සම්බන්ධයෙන් ලකුණු 03ක්ද, නායකත්වයට ලකුණු 05ක්ද, සන්නිවේදන හැකියාවට ලකුණු 08ක්ද, සේවා පළපුරුද්දට ලකුණු 13ක්ද වශයෙන් මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 49ක් ලබාගෙන ඇති බවයි. ඒ අනුව සම්මුඛ පරීක්ෂණයේදී සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය වන 60% ලකුණු ප්‍රතිශතය ලබානොගැනීම මත පැමිණිලිකාර එස්.එම්.එස්.යූ.සේනාරත්න යන අය සහකාර ගුවන් තොටුපල කළමනාකරණ තනතුර සඳහා තේරී පත්වීමට සුදුසුකම් නොලබන බව වැඩිදුරටත් දක්වා ඇත.

ක්ෂේත්‍රයේ වඩා පළපුරුදු සේවකයින් ආයතනයට බඳවා ගැනීමේ අරමුණින් මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවන වයස් සීමාව අවුරුදු 45 දක්වා වැඩි කර ගැනීමට අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලෙසට ආයතනයේ මානව සම්පත් හා වැටුප් කමිටුව විසින් නිර්දේශ කරන ලද බවත්, ඒ අනුව එම තනතුර සඳහා අයදුම් කරන ලද බාහිර අයදුම්කරුවන්ගේ වයස් සීමාව අවුරුදු 40 දක්වා වැඩි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති බවයි. ඒ අනුව එම තීරණය මත පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රශ්ණගත කරන අයදුම්කාර ආර්.එස්.ඒ.ප්‍රදීප් මහතාට පමණක් නොව වයස අවුරුදු 40 දක්වා වූ සියළුම බාහිර අයදුම්කරුවන්ට සහකාර ගුවන් තොටුපල කළමනාකරණ තනතුරට අයදුම් කිරීමට හැකියාව ලැබුනු බවයි.

තවද පැමිණිලිකරු සඳහන් කරන සී.ඒ.එන්.ඩී.පෙරේරා නැමති අයදුම්කාරිය විසින් සහකාර ගුවන් තොටුපල කළමනාකරණ තනතුර සඳහා ඉල්ලුම් කර ඇති මූලික උපාධිය වෙනුවෙන් ඇයගේ පශ්චාත් උපාධිය සලකා බලන ලෙසට ආයතනය වෙත දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කරන ලද බවත්, ඒ අනුව ආයතනය විසින් ඒ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් උපදෙස් විමසා ඇති බවත්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒ පිළිබඳව ඔවුන්ගේ නිර්දේශය ඉදිරිපත් කරමින්, සී.ඒ.එන්.ඩී.පෙරේරා මහත්මියගේ පශ්චාත් උපාධිය සලකා බලමින් ඇයට මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසත්, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගන්නා ලෙසට ආයතනයේ මානව සම්පත් හා වැටුප් කමිටුව නිර්දේශ කරන ලද බවත්, ඒ අනුව ඇයට එම තනතුර සඳහා අයදුම් කිරීමේ අවස්ථාව ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී ඇති බවයි.

වගඋත්තරකාර පාර්ශවය තවදුරටත් කරුණු දක්වමින්, පැමිණිලිකාර පාර්ශවය සම්මුඛ පරීක්ෂණය සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය වන 60% ප්‍රතිශතය ලබානොගැනීම මත ඔහුව එම තනතුරට තෝරාපත් කර ගැනීමට නොහැකි වූ බව වැඩිදුරටත් දක්වා ඇත.

<u>නිරීක්ෂණ සහ නිගමන :</u>

පැමිණිලිකාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සහ ලේඛන අනුව පහත සඳහන් නිරීක්ෂණ සහ නිගමන ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු සහකාර ගුවන් තොටුපල කළමනාකරණ තනතුර සඳහා පවත්වන ලද තරඟ විභාගයෙන් ලකුණු 88 ක් ලබාගෙන දෙවන ස්ථානයට පත්වී ඇත.

2024.05.06 දින සහකාර ගුවන් තොටුපල කළමනාකරණ තනතුර සඳහා පත්කරන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන ලද නිර්ණායකයන් වන,

- රැකියා දැනුම,
- ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව,
- නායකත්ව හැකියාව
- සන්නිවේදන හැකියාව

යන නිර්ණායකයන්ට ලකුණු ලබාදීමේ අභිමතය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සතු වේ. ඒ අනුව මුළු ලකුණු 100 න් 70ක් එනම්, 70%ක ලකුණු ප්‍රමාණයක් ලබාදීමේ අභිමතය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

වෙනත් සුදුසුකම් සහ පළපුරුද්ද සඳහා ලකුණු 30ක් ලබාගත හැකි අතර, ඒ සඳහා නිර්ණායකයන් මත ලකුණු ලබාදීමක් සිදුකරන බවත්, එම අයිතමයන් දෙකට පැමිණිලිකරු විසින් උපරිම ලකුණු ලබාගෙන ඇති බවටත් නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරු ප්‍රශ්නගත කර සිටින ඉල්ලුම්කාර සී.ඒ.එම්.ඩී පෙරේරා මහත්මියට මූලික සුදුසුකම වන මූලික උපාධිය නොමැති බවට නිරීක්ෂණය වන අතර, ඉල්ලුම්කාර ආර්.එස්.ඒ.ප්‍රදීප් මහතා බඳවා ගැනීමේ පරිපාටිය අනුව බාහිර අයදුම්කරුවන්ගේ වයස් සීමාව අවුරුදු 35 ඉක්මවා ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු මීට ඉහත අවස්ථාවකදී මෙම තනතුර සඳහා ඉල්ලුම් කර ඇති අතර, එම අවස්ථාවේදී ඔහුට මූලික උපාධියක් තිබී නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් ඔහු කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප කර ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තරකාර ආයතනය විසින් බඳවා ගැනීමේ පරිපාටියෙන් පරිබාහිරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන ඇත.

සම්මුඛ පරීක්ෂණයේ සමත් ලකුණු ප්‍රමාණය 60% ප්‍රතිශතයක් විය යුතු අතර, පැමිණිලිකරු ලබාගෙන ඇත්තේ ලකුණු 49ක් බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාර පාර්ශවය පැමිණිල්ල මඟින් දක්වා සිටින්නේ, අයදුම්කරුවන් දෙදෙනෙකුට පුද්ගලික හිතවත්කම් මත සම්මුඛ පරීක්ෂණයේදී අදාළ උසස්වීම් ලබාදීමට කටයුතු කර ඇති බවයි. මෙහිදී ඉදිරිපත් වී ඇති කරුණු සැලකිල්ලට ගැනීමේදී ගුවන් සේවා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත බඳවා ගැනීම් පරිපාටියේ මූලික සුදුසුකම් වෙනස් කිරීමකට ලක් කර ඇති අතර, එසේ වෙනස් කිරීම මඟින් අයදුම්කරුවන් දෙදෙනෙකුට විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බව පෙනීයයි.

බඳවා ගැනීමේ පරිපාටියක් කාලානුරූපීව වෙනස් විය යුතු නමුත්, එය සංශෝධනය කිරීමේදී ඒ සඳහා සේවා සේවකයන් යන දෙපාර්ශවයේම සහභාගිත්වය මත විනිවිදභාවයෙන් කටයුතු කිරීම වැදගත් වන අතර, යම් තනතුරක් ඉලක්ක කරමින් ආයතනය තුළ පවතින බඳවා ගැනීමේ පරිපාටියක් සංශෝධනය කිරීම සුදුසු නොවන බව කොමිෂන් සභාවේ හැඟීම වේ.

තවද, බඳවා ගැනීම් පරිපාටිය වෙනස් කිරීමට මුල් වී කටයුතු කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ද මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකත්වය දරා ඇති අතර, එවැනි අවස්ථාවක මෙවැනි ලකුණු ලබාදීමේ පරිපාටියක් තුළ ඔවුන්ගේ අභිමතය පරිදි තමන් කැමති අයදුම්කරුවන්ට ලකුණු ලබාදීමේ අවස්ථාව උදාකර ගත හැකි බව කොමිෂන් සභාව තවදුරටත් නිරීක්ෂණය කරනු ලැබේ.

එසේම, පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 70ක්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ අභිමතය පරිදි ලබාදීමට හැකියාව පවතින බව වගඋත්තරකරුවන් විසින්ම පිළිගන්නා අතර, එම සම්මුඛ පරීක්ෂණයේ පාරිශුද්ධභාවය සහ විනිවිදභාවය සම්බන්ධයෙන් සාධාරණ සැකයක් මතුවේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි ලකුණු 70ක් වැනි ඉතා විශාල ලකුණු ප්‍රමාණයක් ලබාදීමට අවස්ථාව ඇතිවීම තුළින් වඩාත්ම සුදුසු පුද්ගලයා තෝරා පත්කර ගැනීමේ හැකියාව පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් මතුවන අතර, එවැනි ක්‍රියාදාමයක් තුළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කැමති පුද්ගලයෙකු තෝරා ගැනීමට අවස්ථාව හිමිවේ.

මෙම උසස්වීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පැය 03ක තරඟ විභාගයක් පවත්වා ඇති අතර, එම තරඟ විභාගය තුළින් රැකියා පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇති අතර, එම විභාගයෙන් පැමිණිලිකාර පාර්ශවය ලකුණු 88 ක් ලබාගෙන දෙවන ස්ථානයට පත් වී ඇත. නමුත්, සම්මුඛ පරීක්ෂණයේදී රැකියා දැනුම සම්බන්ධයෙන් පැමිණිලිකරුට හිමිවී ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 10ක් වේ.

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පරිපාටියේ රැකියා දැනුම සඳහා ලකුණු 30ක් වෙන් කර ඇත. සාමාන්‍යයෙන් එක් අයදුම්කරුවකු සමස්ත සම්මුඛ පරීක්ෂණයේදීම පරීක්ෂණයට භාජනය කරන කාලය විනාඩි 10 -15 ක් වන අතර, එකී කාලය තුළ ඔහුගේ රැකියාව පිළිබඳ දැනුම ගණනය කිරීම කොපමණ දුරට ප්‍රායෝගික ද යන්නත්, රැකියා දැනුම උරගා බැලීම සඳහා පවත්වන ලද තරඟ විභාගයේ දී ලකුණු 88ක් ලබාගත් පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 10ක් ලබාදීම කිනම් ආකාරයකින් සිදුකලේද යන්න ගැටළු සහගත වන අතර, එසේ කිරීමට හැකියාවක් පවතින්නේද යන්න ප්‍රශ්ණගත වේ.

ඒ අනුව මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී ලකුණු ලබාදීමේ සම්පූර්ණ ක්‍රියාදාමයම දෝෂ සහගත සහ විනිවිදභාවයෙන් තොර ක්‍රියාවලියක් බව තහවුරු වන අතර, මෙම සම්මුඛ පරීක්ෂණයේදී සමානාත්මතාවයේ රැකවරණය ලැබීමට පැමිණිලිකාර පාර්ශවයට ඇති අවස්ථාව මඟ හැරී ඇති බවත්, එමඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති පැමිණිලිකාර පාර්ශවය ඇතුළු බහුතර අයදුම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් කර සිටී.

1. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් එම සම්මුඛ පරීක්ෂණයට මුහුණදුන් ආකාරය අනුව ලකුණු ලබාදීම, උපරිම ලකුණු මට්ටම 30%ක් නොඉක්මවන ආකාරයට ලකුණු ලබාදීමේ පරිපාටියක් සකස් කළ යුතු අතර, එකී පරිපාටිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව දැනුම්වත් කිරීමට ද වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යුතුය.

2. වගඋත්තරකාර ආයතනය තුළ පුරප්පාඩු පිරවීමේදී, ඉදිරි සම්මුඛ පරීක්ෂණ වලදී ලකුණු ලබාදීමේ නිර්ණායකයන් පැහැදිලි හා නිවැරදිව දැක්විය යුතු අතර, ඒ සඳහා ලකුණු ලබාදීමේදී එකී පැහැදිලි නිර්ණායකයන් දක්වන උපදෙස් මාලාවක් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

3. මෙහි සඳහන් පරිදි නිවැරදි ක්‍රියා පටිපාටියට බාහිරව පත්කර ඇතැයි අදහස් කරනු ලබන තැනැත්තන් පිළිබඳව අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පරීක්ෂණයක් පවත්වා, එහිදී සාවද්‍ය ලෙස පත්කිරීම් කර ඇති බව අනාවරණය වන්නේ නම්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව හා අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතු අතර, ගනු ලබන පියවර පිළිබඳව කොමිෂන් සභාව දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතුය.

2025.08. 21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකාර පාර්ශවය වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :01. අමාත්‍යතුමා, - දැනගැනීම සඳහා
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර, කොළඹ.

02. ලේකම්, - (3 වන නිර්දේශය ක්‍රියාත්මක කර ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම්දීම සඳහා)
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර, කොළඹ.

ස/-